මම හුදකලා සටන්කරුවෙක් නොවෙයි

ජයතිලක බණ්ඩාර

ඔබ කලාවට යොමුවෙන්නේ කොයි විදිහටද?

උසස් පෙළ පන්තිවල ඉන්නකොට තමයි මම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙලා, ඒ අරගලයේ කොටස්කාරයෙක් බවට පත්වෙලා හිරගෙවල්වල ඉන්න කාලේ කලාව, සාහිත්‍ය උපයෝගී කරගන්නවා චිත්ත ධෛර්යය ගොඩනගාගන්න. අනික් අයගේ චිත්ත ධෛර්යය වැඩි කරන්නට. එතන තමයි ආරම්භය.

ඔය කියන්නේ කොයි කාලෙද?

1971 අවසාන භාගයේ මම සිරගත වෙනවා. ඉන්පසු වසර දෙකකට පසුව නිදහස් වෙනවා. නැවත අත්අඩංගුවට ගන්නවා. නැවත නිදහස් වෙනවා. හිර ගෙදර වළක් භාරගෙන අපි පිරිසක් පළා යනවා. නැවත අත්අඩංගුවට ගන්නවා. ඉන්පසු නිදහස් වෙලා ඇවිත් ජනතා විමුක්ති පෙරමුණේ විමුක්ති ගී ප්‍රසංගයට සම්බන්ධ වෙනවා. එහිදී ඇති වූ මතවාදී ගැටුම් නිසා ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වෙනවා.

යුද්ධයට එරෙහිව ඔබ 'සාදු ජන රාව' නමින් ගී ප්‍රසංගයක් කළා. එය ඇරඹුණේ කොහොමද?

විමුක්ති ගී ප්‍රසංගයෙන් ඉවත් වුණාට පස්සේ මම රජරට සේවයට සම්බන්ධ වෙලා කපුගේලා සමග 'කාලයේ රාවය' ගී ප්‍රසංගය ආරම්භ කරනවා. ඉන්පසු කපුගේත් මමත් සිව්දෙනෙකු ගුවන් විදුලියේ වැඩ තහනමකට ලක්වෙනවා. පසුව අපි කම්පන ගී ප්‍රසංගය ආරම්භ කරනවා. ඉන්පසු නැවත ගුවන් විදුලියට සම්බන්ධ වුනාට පස්සේ 'ගී රසවින්දන' නමින් රට පුරා සාහිත්‍ය පිළිබඳ තරුණ පරපුර දැනුම්වත් කරන, ඔවුන් සමග සම්බන්ධයක් ඇති කරගැනීමේ වැඩසටහනක් ආරම්භ කරනවා. ඒ කාලේම තමයි 1995 දී අපි 'සාධු ජන රාවය' ආරම්භ කරන්නේ.

ඒ නම පවා ගී ප්‍රසංගයකට ටිකක් අමුතුයි. මොකක්ද සාධු ජන රාවය?

යුද්ධයට එරෙහිව සාමයේ සුන්දරත්වය පසක් කරන්නට කළ ගීතමය ප්‍රසංගයක්. ඒක රටපුරා සෑම දිස්ත්‍රික්කයකම කළා. උතුරේ ඉතාම බිහිසුණු කාල වකවානුවලත් උතුරේ ජනතාව සමග සාධු ජනරාවය අපි පවත්වන්නේ සාමය පිළිබඳව අපේ තිබුණ බලාපොරොත්තුව ඔවුන්ට ප්‍රකාශ කරන්නට. එය සිංහල, මුස්ලිම්, දෙමළ සියලු ජන කොටස් සමග කරන සාමයේ කතිකාවක් බවට පත් කරන්නට. මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව ආවට පසුව යුද්ධය පටන් ගන්නවා. මිනිස්සුන්ගේ සිත් තුළ තිබෙන සංකල්ප නිසා මේ ක්‍රමයෙන් මිදෙන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. යටත් වැසියන් වශයෙන් ජීවත් වෙන්නට මිනිසුන් හුරු කරනවා.

දීර්ඝ කාලයක් තිස්සේ කලාව දේශපාලන සටන් කලාවක් කරගත් ඔබට දරාගන්න බැරි දේවල් පහුගිය කෙටි කාලය ඇතුළත සිදුවුණා නේද?.

පහුගිය ජනාධිපතිවරණයේදී මැතිවරණ කටයුතු හා සම්බන්ධ කරගෙන මහින්ද රාජපක්ෂගේ රෙජිමය විසින් ක්‍රියාත්මක කරන ලද වියරුවට පරාජය කිරීමට 'විදියේ විරෝධය' නමින් අපි විදි ප්‍රසංගයක් පටන් ගන්නවා. ගීත, විදි නාට්‍යය, බෙර වාදන ඊට ඇතුළත් වෙනවා. යුද්ධයේ ඉතාම දරුණු අවස්ථාවළදීවත් සිදුනොවුණු විදිහට අපිට මහපාරේදී රාජපක්ෂ රෙජිමයේ මැරයන්ගෙන් ගුටි කන්න සිද්ධ වෙනවා. එප්පාවළදී, හම්බන්තොටදී අපිට පාර දිගේ මැරයෝ පහර දෙනකොට ඒ මැරයන්ට ශක්තිය දෙන මහින්ද රාජපක්ෂගේ දෑත් ශක්තිමත් කරන්න එකතුවෙලා ඉන්නේ එදා සූරියකන්ද ගැන මම ගැයූ ගීයට සංගීතය නිර්මාණය කළ රෝහණ වීරසිංහ, අපි එක්ක එදා රජරට සේවයේ හිටිය කරුණාරත්න දිවුල්ගනේ වැනි අය. මැරයන්ගේ පහරවළුවලට වඩා මට දරාගන්න බැරිවුණේ මේ පුද්ගලයන්ගේ ක්‍රියා කලාපයි.

අද වෙනකොට ඔබ අපේක්ෂා කළ දේශපාලන වෙනස සිදුවෙලා තියනවා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණත් ඔවුන්ගේ අතීත දේශපාලන විග්‍රහයන්ගෙන් ඉවත් වෙලා. සමාජවාදය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිසංස්කරණ ඉල්ලන තැනකට ඇවිත්. ජනතා විමුක්ති පෙරමුණේ සමග නැවත එක්වීමට ඔබට දැන් තියන බාධාව මොකක්ද?

මම ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වෙන්නේ ජනවාර්ගික ප්‍රශ්න සමග ඇතිවු මතභේදයක් නිසා. මම ඒ ජාතිවාදී ස්ථාවරයට විරුද්ධ නිසා. පහුගිය කාලය තුළත් ඔවුන් ඒ ස්ථාවරයේම පිහිටියා. ඒ ස්ථාවරය සනිටුහන් කරමින් තමයි ඔවුන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ගමනට උදව් කරන්නේත්. අද ඔවුන්ගේ යම් වෙනසක් අපි දකිනවා තමයි. නමුත් මට ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් වීමට තරම් ඒ මතවාදය වෙනසකට ලක්වෙලා නැහැ. නමුත් ඔවුන්ගේ සාධනීය ලක්ෂණයන් තියෙනවා. ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔවුන්ගේ ස්ථාවරය අපැහැදිලි නිසා මම තවමත් ඔවුන් හා වෙන් කළ ඒ බෙදුම් රේඛාව කඩාගෙන යාමට තරම් ඉඩක් සළසා දෙන්නේ නැහැ.

හුදකලා සටන්කරුවෙක් විදිහට ඔබ සිවිල් සමාජ ක්‍රියාකාරී කණ්ඩායමක් මේ විදියට සකස් කරගෙන එය දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යන්නේ කොහොමද?

මම විශ්වාස කරන්නේ නැහැ මම හුදකලා පුද්ගලයෙක් කියලා. සෑම අවස්ථාවකදීම අපගේ කලා කටයුතු හා ඒ කලා කටයුතු වර්ධනය කරගන්නට පිරිසක් හිටියා. ඔවුන්ගේ දායකත්වය මත තමයි මේ දේ සිදුවෙන්නේ. එහි ප්‍රකාශකයා විදියට ජයතිලක බණ්ඩාර පත්විය හැකියි. නමුත් මේ කටයුතු සාර්ථක කරගන්නට මා සමගින් පිරිසක් හිටිය බව අමතක කරන්න බැහැ. ඒ සියලු දෙනාගේ උත්සහයේ ප්‍රතිඵලයක් ලෙස තමයි ජයතිලක බණ්ඩාර තුළින් එවැනි කලා නිර්මාණ ප්‍රකාශයට පත්වෙන්නේ. මුළුම කාලයේ රජරට සේවයෙන් අපිව එළියට දැමූ අවස්ථාවේ රජරට සේවයේ සේවය කළ කපුගේගෙන් උපහා ගත් ඒ කලා භාවිතාවන් අපි පාවිච්චි කරනවා. ඊට පසුවත් සාමය පිළිබඳව උනන්දුව දක්වන යහපත් මිනිසුන්ගේ, යහපත් ගැහැනුන්ගේ සහයෝගය මේවට ලැබෙනවා. ඒ තුළ තමයි අපේ නිර්මාණ සමාජ ගත කරන්නට උත්සහා කරන්නේ. අපේ කලා භාවිතාව මුළින්ම සකස් කරගන්නේ ඉතාම අඩු මෙවලම් සහිතව සහ අඩු වාදක මණ්ඩලයක් යොදා ගනිමින්. නමුත් ඉතාම දක්ෂ මේ කලාකරුවන් කිහිප දෙනාත් එක්ක තමයි අපි මේ ගමන යන්නට සුදානම් වෙන්නේ. කලාකරුවෝ සුලු පිරිසක් යොදාගෙන අඩු මෙවලම් භාවිතා කරගෙන මේ කටයුත්ත පවත්වාගෙන යාම අපහසු වෙන්නේ නැහැ. එය පෝ ෂණය කරන්න මිනිසුන්ටත් තදබල අපහසුතාවලට මුහුණ දෙන්න වෙන්නේ නැහැ. ඉතා සුලු පිරිවැයකින් ගමන් වියදම් පියවා ගැනීමට, ඔවුන්ව පෝෂණය කරගෙන ඉදිරියට යාමට ඉඩකඩක් සමාජයට ලැබෙනවා. ඒ පදනමින් තමයි මේ සංගීත කණ්ඩායමට මේ තරම් කාලයක් අපත් සමග එකට වැඩ කරන්නට ඉඩකඩ ලැබිලා තියෙන්නේ.

ඔබගේ භාවිතාවන් සහ දීර්ඝකාලීන අත්දැකීම් අනුව ඔබ විශ්වාස කරනවාද ලංකාවේ ජනතාවගේ මනස දේශපාලනික වශයෙන් කිසියම් වෙනසකට ලක් කරන්නට කලාවන්ට හැකියාවක් තියෙනවා කියලා?

පැහැදිලිවම මම විශ්වාස කරනවා. සාහිත්‍ය කලාවෙන් පුලුවන් මිනිසුන්ගේ මතවාදවලට බලපෑමක් කරන්නට. කෙටි කතාවට, නව කතාවට, නාට්‍යයට, චිත්‍රපටයට, කවියට, ගීතයට මිනිසුන්ගේ හදවත් ස්පර්ශ කරන්නට අවස්ථාව ලැබෙනවා. අපි වෙනස් වුණොත් ඒ සාහිත්‍යය නිසා. ඒ නිසා අපට පුලුවන්කම තියෙනවා මිනිසුන්ගේ හදවත් ස්පර්ශ කරන්නට. රැස්වීම් සිය ගණනකින්, සම්මන්ත්‍රණ සිය ගණනකින් කරන කටයුත්තක් එක කෘතියකින් කළ හැකි බවට අප විශ්වාස කරනවා.

යථාර්ථය මොකක්ද?

දැනට මාස තුනකට පමණ පෙර කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට නාමල් රාජපක්ෂත් සමග ගිය ඉරාජ් නැමැති ගායකයා විසින් ඉදිරිපත් කළ ගීතයක් එම පාසලේ ශිෂ්‍යාවන් විසින් ප්‍රතික්ෂේප කරනු ලබනවා. ඊට පෙර දවසේ ඒ ශිෂ්‍යාවන්, ඒ ගුරුවරුන් සමග අපි ගී රසවින්දන වැඩසටහන කළා. සාහිත්‍ය පිළිබඳව කතිකාව. යහපත් ගීත පිළිබඳව අත්දැකීම් කතා කරමින් කරන පැය තුනක පමණ වැඩසටහනක් එය. අපි එය සාර්ථකව කරනවා. එම ශිෂ්‍යාවන් එයට සහභාගී වෙනවා. ඊට පහුවෙනිදා ඉරාජ් නැමැති ගායකයාත්, ජනාධිපතිවරයාගේ පුතා නාමල් රාජපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත් මේ පාසලට ගිහින් උම්මා උම්මා කියන කිසිම විනයක් ශික්ෂණයක් නොමැති හරසුන් ගීතය ගායනා කරනවා. ඉන්පසු ඒ ශිෂ්‍යාවන් විසින් ඒ ගීතය ප්‍රතික්ෂේප කරනවා. ඔවුන් වේදිකාවට නැගලා කෑගහලා කියනවා මේ පාසලෙන් එළියට යන්න කියලා. මෙවැනි අත්දැකීම්

සංවාද සටහන සහ ඡායාරූප

ශ්‍රීලාල් සෙනෙවිරත්න

අපට බොහෝ තිබෙනවා.

පහුගිය කාලයේ අපි 'විදියේ විරෝධය' පවත්වන විට බියෙන් හැකිලගත් මේ සමාජයේ තිබුණේ බරපතල නිහැඬියාවක්. මේ සියලු අයුක්ති සහගත වුත්, අසාධාරණ වුත්, පාලන ක්‍රමයට එරෙහිව කතා කරන්න මිනිසුන් බිය වෙලා හිටියේ. විරුද්ධ මතධාරීන් මරා දමනවා. තර්ජනය කරනවා. පුරවැසියන් යටත් වැසියන් බවට පත්වෙලා. ඉතින් අපේ උත්සහය වුණේ එය කඩා දමන්නටයි. විදියේ විරෝධය පවත්වද්දී අපි පාරට බැහැලා කිව්වා අපි මහින්ද රාජපක්ෂට බය නෑ කියලා. මේ දුෂ්ට පාලනය පලවා හැරිය හැකියි, පලවා හැරිය යුතුයි කියලා අපි කිව්වා. ඒ ගැන ගීත ගායනා කළා. කලාකරුවෝ පෙළ ගැහෙන්නට පටන් ගත්තා. මිනිස්සු පෙළ ගැහෙන්නට පටන් ගත්තා. අපට එක්තරා දුරකට පුලුවන් වුණා මිනිසුන්ගේ සිත් තුළ තිබු බිය සැක සංකා තුරන් කරන්නට. ඒ නිසා තව දුරටත් අපි විශ්වාස කරනවා කලාවට හා සාහිත්‍යයට මිනිසුන්ගේ සිතුම් පැතුම් වෙනස් කළ හැකි බව.

වර්තමාන ආණ්ඩුව පත් කරගැනීමට ක්‍රියාකාරී වූ පුරවැසි බලය ඇතුළේ ඔබත් ඉදිරියෙන්ම සිටියා. අලුත් ආණ්ඩුවත් පත්වෙලා දින කිහිපයක් යනකොටම විවේචනයට ලක්වෙමින් තියෙනවා. ඒ ගැන මොකද හිතන්නේ ?

මේ පිළිබඳව අපි ආණ්ඩුව පත්වෙන්න පෙර සිටම කතා කළා. කිසිවෙක් විශ්වාස කළ හැකි ඉතිහාසයක් නෙවෙයි අපට තියෙන්නේ. අප ඉදිරියේ දහසක් පොරොන්දු දුන්න දේශපාලනඥයන් ඒවා කඩ කරන ඉතිහාසයක් තමයි අපි දැකලා තියෙන්නේ. ඒ අත්දැකීම් අපි අමතක කරන්නේ නැහැ. ඒ වැඩපිළිවෙළත් අපි විශ්වාස කරන්නේ නැහැ. දේශපාලනඥයන්ට හොරුන් බවට පත් නොවීමට, වංචනිකයන් බලලෝභීන් බවට පත් නොවීමට යාන්ත්‍රණයක් ගොඩ නැගිය යුතුව තිබෙනවා. ඒ යාන්ත්‍රණය මනයි අපි විශ්වාස කරන්නේ වෙනසක් කියලා. අපේ සටන් පාඨය වෙලා තිබුණේ වෙනසක්. ඒ වෙනස ප්‍රතිසංස්කරණ සමග සිදුවිය යුතුයි. ඒ ප්‍රතිසංස්කරණ දැන් අපි ඉල්ලා සිටිනවා. තීරණ ගැනීමේ අයිතිය, පාලන තන්ත්‍රය තුළ ස්ථාපිත කළ යුතු කොමිසන් සභා, අනිසි ප්‍රතිඵල සහිත විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම ආදි බොහෝ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. ඒ තුළිනුයි මේ සමාජය යහපත් කළ හැක්කේ. ඕනෑම පුද්ගලයෙකුට තමන්ගේ සිත වෙනස් කරන්නට බලය කියන සාධකය බලපානවා. මුදල් බලපානවා. මේවා මිනිසුන් විනාශ කරනු ලබනවා. නමුත් වැඩපිළිවෙළක් තුළ ගිලෑස කළ විට ඒ තත්ත්වය වෙනස් කළ හැකි යි. ඒ සඳහා තමයි අපි උත්සහා ගන්නේ. මෙවර ජනාධිපතිවරණයේ ජයග්‍රහණය අපි භුක්ති විඳිය යුත්තේ එහෙම. ඒ සඳහා අප සුදානම් විය යුතුව තිබෙනවා. ආණ්ඩුව සමග එක්ව කටයුතු කරමින් සහ ආණ්ඩුවෙන් පිටත සිටින මිනිසුන් දැනුම්වත් කරමින් බලාපොරොත්තු වෙන ප්‍රතිසංස්කරණ කිරීම සඳහා අවශ්‍යය සුභවාදී වාතාවරණයක් මේ සමාජය තුළ ඇතිකරගත යුතුව තිබෙනවා.

ඔබ ෆේස්බුක් පිටුවක පණිවිඩයක් නිකුත් කරලා තියෙනවා තනතුරුවලට නිසි පුද්ගලයන් පත් කරන්න කියලා. මේ පණිවිඩය දෙන්නට හේතු වුනේ මොනවගේ කාරණාද?

මේ රටේ සංස්කෘතිය තමයි ආණ්ඩුවත් පාලනයත්

18 වන පිටුව

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com